# දහවන සියවසේ සෙල්ලිපිවල ඇතුළත් බදු ක්‍රම පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සෙල්ලිපි ඇසුරින්)

ජී. ඩී. රංගිකා චතුරංගනී ගංගොඩවිල
කැලණිය විශ්වවිද්‍යාලය
gangodawilarangikachathurangan@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලාංකේය ඉතිහාසය ගොඩනගන්නෙකුට සෙල්ලිපි තරම් අගය කළ හැකි වෙනත් ප්‍රාථමික මූලාශ්‍රයක් නැති තරම් ය. ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ සිට ක්‍රමයෙන් සෙල්ලිපි විකාශනය වූ අතර එමගින් ලක්දිව දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික හා ආගමික යනාදි සෑම ක්ෂේත්‍රයක් පිළිබඳ ව ම කරුණු හෙළිවෙයි. ක්‍රිස්තු වර්ෂ දසවන සියවසේ සෙල්ලිපි මගින් ප්‍රකාශ වන්නේ යුගාවලි වශයෙන් ගතහොත් මධ්‍යතන සිංහල අවධිය යි. මෙම අවධියේ ආර්ථික ක්‍රියාවලියේ මූලික ආදායම් ක්‍රමය බවට පත් වූයේ බදු අය කිරීම ය. බද්දක් යනු සෘජු ප්‍රතිලාභ නොලබා රජයට කළ යුතු අනිවාර්ය ගෙවීමකි. ඒ අනුව බද්ද වනාහි පෞද්ගලික දේපළ හිමියන් විසින් රජයට සහයෝගයක් වශයෙන් ගෙවන ලද ගෙවීමක් ලෙස හැඳින්විය හැකි ය. ක්‍රිස්තු වර්ෂ දසවන සියවසේ ලියවුණු සෙල්ලිපි මගින් හඳුනාගත හැකි බදු වර්ග පිළිබඳ ව තොරතුරු අනාවරණය කර ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ යි. දහවන සියවසේ සෙල්ලිපිවල ඇතුළත් බදු ක්‍රම පිළිබඳ හා එහි ස්වභාවය හා රාජ්‍යය පාලනයට එකී බදු ක්‍රමය දායක වූයේ කෙසේ ද? යන්න මෙම පර්යේෂණයට පාදක වන පර්යේෂණ ගැටලුව වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික හා ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය යොදාගනිමින් පර්යේෂණය සිදුකර තිබේ. දසවන සියවසේ සෙල්ලිපි මගින් බදු ක්‍රම සම්බන්ධයෙන් පනවන ලද ව්‍යවස්ථා රෙගුලාසි හා විධි විධාන පිළිබඳ ව විමසීමේ දී රජයේ අවශ්‍යතා පූරණය සඳහා විටෙක බදු අය කළේ ද්‍රව්‍ය වශයෙන් හෝ මූල්‍යමය වශයෙනි. එනම් මානව ශිෂ්ටාචාරයේ රාජ්‍ය යන සංකල්පය මතුවීමත් සමඟ ම යම් යම් අවශ්‍යතා අරමුණු කොටගෙන බදු අය කළ බවට සෙල්ලිපි සාක්ෂ්‍ය දරයි. ක්‍රිස්තු වර්ෂ දසවන සියවසේ ලියැවුණු තෝරාගත් සෙල්ලිපි කිහිපයක දැක්වෙන මෙලාට්සි, දසවිධ, ගම්පාට්ට, පෙරනාට්ටියම්, රට්දග්, පාට්ට, අයබදු, තෙල්පද්ද, සුත් බඩු, වරද දඩ අට, රද්දඩ, උල්වාඩු, ගෙදඩ්, සිහින්දඩ, කීණ, කොදඩ්, බිම්සොවස්, කුලී, මහවර්, යනාදි වශයෙන් බදු ක්‍රම රාශියක් පිළිබඳ ව කරුණු අනාවරණය විය. මෙම අධ්‍යයනයෙන් ක්‍රිස්තු වර්ෂ දසවන සියවසේ ක්‍රියාත්මක වූ බදු ක්‍රම ඔස්සේ සංවිධිත සමාජයක් බිහිකිරීමට රජවරුන් ගත් උත්සාහය කෙතරම් ද යන්න පිළිබඳ මනා අවබෝධයක් ලබාගත හැකි වූ බව සඳහන් කළ යුතු ය.

**ප්‍රමුඛ පදඃ** අනුරාධපුරය, ආර්ථිකය, දසවන සියවස, බදු ක්‍රම, සංවිධිත සමාජය.

# An Investigation on the Nature of Taxation in Inscriptions Belong to 10th Century A.D (Based on Selected Inscriptions)

G.D. Rangika Chathurangani Gangodawila
University of kelaniya
gangodawilarangikachathurangan@gmail.com

**Abstract**

There is hardly any primary source that a person who investigates Sri Lankan history can appreciate more than the inscriptions. Inscriptions, which trace their origins back to the third century B.C., reveal facts about every field of politics, economy, society, culture, and religion. Inscriptions of the 10th century A.D. reveal the medieval Sinhalese period in terms of epochs. Taxation became the primary source of income in the economy at this stage. A tax is a compulsory payment to the government without direct benefits. Accordingly, tax can be described as a payment made by private property owners as support to the government. The main purpose of this research is to uncover information about the types of taxes that can be identified by the inscriptions written in the tenth century AD. The nature of the tax system included in the inscriptions of the tenth century and how the tax system contributed to the government is the research problem of the present study. Data were gathered using primary and secondary literature sources under the qualitative research method. In inquiring about the constitutional regulations and provisions imposed by the inscriptions of the tenth century, taxes were sometimes levied materially or financially to meet the needs of the government. It is evident from these inscriptions that taxes were imposed to cater to specific needs, with the emergence of the state within human civilisation. Findings reveal that numerous tax methods documented in these inscriptions, including *Melātsi, Dasavida, Gampatti, Peranāttiyam, Ratdag, Pātta, Ayabadu, Telpadda, Sut Badu, Warada Dada Ata, Raddada, Ulwādu, Gedad, Sihindada, Kīna, Kodad, Mimsowas, Kulī,* and *Mahawar.*Furthermore, this study illustrates how the kings worked hard to create an organized society through the tax systems implemented in the tenth century AD.

**Keywords: Anuradhapura, economy, 10th century, taxation, organized society.**